# ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය (සංශෝධිත)

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2010.01.11 දින අනුමත කරන ලද ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය (සංශෝධිත)වෙනුවට පහත සඳහන් බඳවා ගැනීමේ පරිපාටිය පළ කරනු ලැබේ.

01. තනතුරු නාමය - ඌව පළාත් රාජ්‍ය සේවයේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර

02. තනතුර අයත් දෙපාර්තමේන්තුව :- ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

අමාත්‍යාංශය ඌව පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය

03. ක්‍රියාත්මක වන දිනය - ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමා අනුමත කරන ලද දිනය වේ.

04. අර්ථ නිරූපණ

04.1 බඳවා ගැනීමේ පරිපාටිය යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය වේ.

04.2 කොමිෂන් සභාව යනුවෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

04.3 ප්‍රධාන ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයා වේ.

04.4 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

04.5 අමාත්‍යාංශ ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

04.6 දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වේ.

04.7 සේවාව යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික සේවය වේ.

04.8 " නියමිත දිනය" යනුවෙන් අදහස් කරනුයේ මෙම සේවයට / බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනය වේ.

04.9 මෙම බඳවා ගැනීමේ පරිපාටියට අදාළ කාර්යයන් සඳහා "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වසර 05 ක සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූද ඒ කාලය තුළ කළ වරදකට අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර දඬුවමක් නැත්තා වූද සේවා කාලයකි.

05. තනතුරේ සාරාංශය

ඌව පළාතේ සියළුම රෝහල් හා සෞඛ්‍ය ආයතනවල වෛද්‍ය උපකරණ හා අනෙකුත් විදුලි උපකරණ අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු කිරීම වේ.

06. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු,අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

06. 1. තෝරා ගනු ලබන්නන් ආයතන සංග්‍රහය,පළාත් සභා මුදල් රීති සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග/රෙගුලාසි හා රජය මගින් හෝ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනට නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

06.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 ප්‍රකාරව පත්වීමේ දින සිට වසර පහක් (05) තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

06.3 ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේද වල විධි විධාන ද අදාළ වේ.

07. වැටුප් ක්‍රමය හා සේවක ව්‍යුහය :-

7.1 සේවක ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය PL -3 - 2006 ඒ
රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860

7.2 සේවක ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක මාසික වැටුප් පියවර

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් පරිමාණය | ආරම්භක වැටුප | වැටුප් කේත අංකය |
|---|---|---|---|---|
| III | පියවර 0 1 | රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860 | රු. 12470 /- | PL - 3- 2006 A |
| II | පියවර 12 | රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860 | රු. 139 15/- | |
| I | පියවර 22 | රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860 | රු. 15380/- | |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860 | රු. 16990/- | |

7.3 සේවක ව්‍යුහය

එක් එක් ශ්‍රේණිය සඳහා වෙන් වූ සේවක සංඛ්‍යාවක් නොමැත. III , II , I සහ විශේෂ ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් වේ.

**08. බඳවා ගැනීමේ සුදුසුකම්**

8.1.1 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -

(අ) **අධ්‍යාපන සුදුසුකම්**

භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන හෝ අර්ධ ශිල්පීය තනතුරක සතුටුදායක වසර 03 ක සේවා කාලයක් සපුරා තිබීම.

(ආ) **වෘත්තීය සුදුසුකම්**

I. ඌව පළාත් රාජ්‍ය සේවයට පත් කරන ලද /අන්තර්ග්‍රහණය කරන ලද ඌව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ස්ථිර නිළධාරියෙකු වීම.

II. විදුලි වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම්, දෝෂ හඳුනා ගැනීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳව වසර 03 ක පළපුරුද්ද

III. රජයේ පිළිගත් ආයතනයකින් විදුලි හෝ විද්‍යුත් ක්ෂේත්‍ර පිළිබඳ අර්ධ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම.

8.1.2 බාහිර අයදුම්කරුවන් සඳහා -

(අ) **අධ්‍යාපන සුදුසුකම්**

භාෂාව, ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් 06 කින් එකවර විෂයයන් 05 කට නොඅඩු දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.

(ආ) **වෘත්තීය සුදුසුකම්**

I. රජයේ පිළිගත් ආයතනයකින් විදුලි හෝ විද්‍යුත් ක්ෂේත්‍ර වලින් තුන් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවක් සමත් වී තිබීම.

හෝ

II. එංගලන්තයේ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ විදුලි හෝ විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පූර්ණ තාක්ෂණික සහතිකය ලබා තිබීම.
(FULL TECHNOLOGICAL CERTIFICATE)

හා

III. අදාළ ක්ෂේත්‍රයේ වසර 3 ක පළපුරුද්දක් ලබා තිබීම. එය රජයේ හෝ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගත් සහතිකයකින් සනාථ විය යුතුය.

8.2 පොදු යෝග්‍යතා :-

8.3.1 යහපත් චරිතයකින් හා මනෝ සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

8.3.2 ඌව පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03 ක වත් ස්ථිර පදිංචිය ඇති පිරිමි අයදුම්කරුවන් විය යුතුය. ඡන්ද හිමි නාම ලේඛණය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

8.3.3 බඳවා ගැනීමට අදාළව අයදුම්පත් කැඳවන දිනට හෝ නියම කරනු ලබන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවෙකුට එනම් ඒ වන විටත් රාජ්‍ය සේවයේ හෝ ඌව පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයෙක් නම් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

09. බඳවා ගැනීමේ ක්‍රමය :-

9.1 ඌව පළාත් රාජ්‍ය සේවයේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% ක ප්‍රමාණය අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් ද , 50% ක ප්‍රමාණය බාහිර අයදුම්කරුවන්ගෙන් ද බඳවා ගනු ලැබේ. සුදුසුකම් සපුරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් , සියළුම පුරප්පාඩු බාහිර අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

(1) දෙපාර්තමේන්තුවේ නිවේදනයක් මගින් පළමුව අභ්‍යන්තර අයදුම්කරුවන් (දෙපාර්තමේන්තුගත ස්ථිර පත්වීම් ලැබූ) අතරින් අයදුම්පත් කැඳවීමෙන් පසුව පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක සහ වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

(II) සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති විට දී රජයේ ගැසට් පත්‍රයේ නිවේදනයක් හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසුව පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත හා වෘත්තිය පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

## විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරේ III වැනි ශ්‍රේණියට අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ තරඟ විභාගයේ විෂය නිර්දේශය

(I) විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය, ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලැබේ.

**විභාග විෂය නිර්දේශය**

(අ) ලිඛිත පරීක්ෂණය

| | විෂය | ලකුණු | කාලය | සමත්වීම සඳහා ලකුණු තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | සාමාන්‍ය දැනීම | 100 | පැ.02 | 40% |
| (ආ) | වෘත්තිය පරීක්ෂණය | 100 | පැ.02 | 50% |
| | | 200 | | |

**සාමාන්‍ය දැනීම :-**

**දේශීය හා විදේශීය භූගෝලීය, ආර්ථික, සාමාජීය හා දේශපාලනික වශයෙන් සාමාන්‍ය දැනීම පරීක්ෂා කරන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.**

**වෘත්තිය පරීක්ෂණය :-**

**පහත සඳහන් විෂයන් යටතේ වෘත්තිය පරීක්ෂණය සිදු කරනු ලැබේ.**

**0 1.** POWER AND ELECTRICITY

Properties of Electricity, Measurment units of voltage, Current and power, Ohm /s Law, Introduction to electrical circuits.

**02.** ELECTRONICS

Introduction to electronic items, Color codes used for the resistors, Introduction to P/N Junction and diode, Transistor and Identification of transistors, Intergraded circuits.

**03.** HOUSE WIRING AND APPLIED ELECTRICITY

Introduction to single phase and three phase electricity, Standards for house wiring, Wiring techniques, Measurment of power

**04.** ELECTRICAL MACHINES

D/C Motors, Single phase motors, Three phase motors, Stardelta conversion, Generations

**05.** MECHANICS OF MACHINES

General Knowledge on properties of materials, Introduction to mechanical power conversion, Piston cylinder arrangement, Water pumps and impellers

* **1/ 16" පරිමාණයක් කියවීමට ඇති හැකියාව**
* **සරළ රයම් පැස්සිම් කිරිම සහ ෆිට් කිරිම පිළිබඳ මුලික දැනුම**
* **පහත සඳහන් විදුලි වෛද්‍ය උපකරණ හා රෝහල්වල භාවිතා කරන වෙනත් තාක්ෂණික උපකරණවල දෝෂ හඳුනා ගැනිම. අලුත්වැඩියා කිරිම්, නඩත්තු කිරිම හා ක්‍රියාත්මක කිරිමේ දි ක්‍රියාකරුවන්ගේ හා රෝගින්ගේ ආරක්ෂාව පිළිබඳ දැනුම**

Dental chair and unit, Ultra Sound, Scalar Machine, ECG Recorder, ENT Head lamp with band, Heavy dirty Nebulizer, Larynogoscope, Mobile X - Ray Unit, Single jar Sucker, Spygmomanometer, Lung function machine, CTG machine, Doppler, Defibrillator, Infusion pump, Multipara Monitor, Pulse Oxymeter, Syringer pump, Transport Ventlator, Binocular, Microscope, Centrifuge, Color meter, Flame photometer, Laboratary Autoclave, Water Distillers, Anesthetic Machine, OT Table, OT Lamp, Theraputic, Ventilator, Infant Warmer, Phototherapy Unit, Biochemistry Analayer (Semi Automated) Baby Incubator, Anesthetic Ventilator.

## 10. කාර්යක්ෂමතා කඩඉම්

**ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය පවත්වනු ලැබේ. කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය ලිඛිත පරික්ෂණයක් වශයෙන් පැවැත්වේ.**

**10. 1** **පළමු කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය අදාළ සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ඇතුළත සමත් විය යුතුය.**

**දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය අදාළ සේවයේ II ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ඇතුළත සමත් විය යුතුය.**

**තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය අදාළ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ඇතුළත සමත් විය යුතුය.**

10\. 1. 1 පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත වේ.

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 01. සාමාන්‍ය කාර්යාල ක්‍රම සහ ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව ආයතන සංග්‍රහයේ පරිච්ඡේද II, III, XII XIII පිළිබඳව මූලික දැනුම පරීක්ෂා කරනු ලැබේ. | පැ. 1 | 100 |
| 02. විදුලි වෛද්‍යයාන්ත්‍රික තනතුරට අදාළ දැනුම පරීක්ෂා කරන ප්‍රායෝගික පරීක්ෂණයකි | පැ. 1 | 100 |
| මුළු ලකුණු | | 200 |

කාර්යක්ෂමතා කඩ ඉම සමත් වීම සඳහා එක් එක් විෂයට ලකුණු 40 % ක් ලබා තිබිය යුතුය. ඉහත සඳහන් විෂයන්ට වෙන වෙනම පෙනී සිටිය හැක.

10\. 1.2 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

මෙය ලිඛිත පරීක්ෂණයකි.

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 01. ආයතන සංග්‍රහය සහ පළාත් මුදල් රීති සංග්‍රහය පිළිබඳ මූලික දැනුම<br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද V, VII, XII, XXIV පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරනු කරනු ලැබේ. | පැ. 1 | 100 |
| 02. පළාත් මුදල් රීති සංග්‍රහය<br>මු.නි.51,52, 54, 55, 144, 145, 215,216 | පැ. 1 | 100 |
| මුළු ලකුණු | | 200 |

කාර්යක්ෂමතා කඩ ඉම සමත් වීම සඳහා එක් එක් විෂයට ලකුණු 40 % ක් ලබා තිබිය යුතුය. ඉහත සඳහන් විෂයන්ට වෙන වෙනම පෙනී සිටිය හැක.

10. 1.3 <u>තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය</u>

මෙය ලිඛිත පරීක්ෂණයකි.

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරට අදාළ විෂයානුබද්ධ දැනුම පිළිබඳ පරීක්ෂා කරන ප්‍රශ්ණ පත්‍රය (බලය හා විදුලිය, විද්‍යුත් උපකරණනඩත්තුව) | පැ. 1 | 100 |
| මුළු ලකුණු | | 100 |

කාර්යක්ෂමතා කඩ ඉම සමත් වීම සඳහා ලකුණු 40 % ක් ලබා තිබිය යුතුය.

10. 1.4 ඉහත සඳහන් පරිදි නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවන තැනැත්තන් පිළිබඳව ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව ක්‍රියාකරනු ලැබේ.

10. 1.5 අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලැබේ.

## 11. උසස් වීම් :-

කාර්ය සාධනය පදනම් කර ගත් පහත දැක්වෙන ආකාරයේ උසස් වීම් ක්‍රමයක් හිමි වේ.

11.1 සේවක ගණයෙහි III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

11. 1. 1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්,

(අ) පූර්ව අවශ්‍යතා

I. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබීම.

II. සේවක ගණයේ III ශ්‍රේණියේ වසර දහයක ( 10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. රාජ්‍ය පරිපාලන 8/98 චක්‍රලේඛ අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් පූර්වාසන්න වසර දහය( 10) තුළ පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

V. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර තිබීම.

VI. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍ර අංක 01 මගින් ආයතන ප්‍රධානියා මගින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව II ශ්‍රේණියට උසස් කිරීම උාව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

11.1.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබීම.

II. III ශ්‍රේණියේ වසර හය (06) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන 8/98 චක්‍රලේඛ අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්න වසර පහ (05) තුළ හොඳයි හෝ ඉහළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර හය (06) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනයේදී සමත් වී තිබීම.

VI. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

VII. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් විභාගය සමත්ව තිබීම.

11.1.3 . සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් වීම් සඳහා විභාග විෂය නිර්දේශය :--

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය දැනුම<br>ආයතන සංග්‍රහයේ II ,VII , XII යන පරිච්ඡේද මත ප්‍රශ්ණ පත්‍රය සැකසේ. මෙය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි | පැය 0 1 | 40 |
| 2. වාචික පරීක්ෂණය<br>අදාළ සේවකයාට පැවරෙන සියළුම කාර්යයන් මැන බැලීම සඳහා වාචික පරීක්ෂණයකි. මේ යටතේ භාෂාමය හැකියාව, පෞරුෂත්වය, තීරණ ගැනීමේ ස්වරූපය මැන බලනු ලැබේ | | 40 |

3. රාජකාරි වැඩ පැමිණිම හා හැසිරිම

වැඩ පැමිණිම හා හැසිරිම සඳහා ලකුණු ආයතන ප්‍රධානින් වෙතින් ලබා ගන්නා රහස්‍ය වාර්තා මගින් තිරණය කරනු ලැබේ. } 20

——
100

මුළු එකතුව

විභාගය සාමාර්ථය සඳහා අවම වශයෙන් ලකුණු 40 % ක් ලබා ගත යුතුය

(ආ) උසස් විමේ ක්‍රමය

මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්පත් ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් කැඳවනු ලැබේ. මෙම විභාගය සඳහා පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ සේවකයින්ට අයදුම් කළ හැක. මෙම විභාගය සඳහා පෙනි සිටිය හැක්කේ එක් වරකි. සෑම වසරකටම එක් වරක් මෙම විභාගය ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ විෂයභාර ලේකම් විසින් පවත්වනු ලැබේ. විභාගය සඳහා ඉල්ලුම් කිරිමට ආකෘති අංක 01 භාවිතා කළ යුතු වේ.

සුවිශේෂි කාර්ය සාධනය යටතේ උසස් කිරිමේ විභාගය සමත් හා අනිකුත් පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් ආයතන ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලිමක් කරනු ලැබූ විට සම්මුඛ පරික්ෂණයකින් පසු පත්විම් බලධාරියා විසින් සුදුසුකම් පරික්ෂා කිරිමෙන් පසු උසස්විම් දෙනු ලැබේ. සම්මුඛ පරික්ෂණයේදි ලකුණු දෙනු නොලැබේ.

## 11.2 සේවක ගණයෙහි II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරිම

### 11.2.1 සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. II ශ්‍රේණියේ වසර දහයක ( 10) සේවා කාලයක් තිබිය යුතුය.

II. උසස්විම් ලබන දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයා ගෙන තිබිම.

III. I හා II කාර්යක්ෂමතා කඩඉම් සමත් වි තිබිය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවිණතාවය ලබා තිබිම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයිම් වාර්තාව අනුව පූර්වාසන්න වසර නවය(09) තුළ සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය ඇසුරින් ආයතන ප්‍රධානියා මඟින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු I ශ්‍රේණියට උසස් කිරීම දාව පළාත් සෞඛ්‍ය දේශීය වෛද්‍ය විෂයභාර ලේකම් විසින් උසස් වීම් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

## 11.2.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. II ශ්‍රේණියේ වසර අටක(08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම .

II. පූර්වාසන්න වසර පහක (05) කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව. උසස්වීමේ පූර්වාසන්න වසර පහ(05) තුළ හොඳයි හෝ රට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. I හා II කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබීම.

VI. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් විභාගය සමත් වී තිබීම.

## 11.2.3 සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් වීම සඳහා විභාග විෂය නිර්දේශය

I වන පන්තියට උසස් කිරීමට අදාළ අභියෝග්‍යතා පරීක්ෂණයේ විෂය නිර්දේශය

මෙම පරීක්ෂණය කොටස් 02 කි.

1. ලිඛිත පරීක්ෂණය
2. ප්‍රායෝගික පරීක්ෂණය

## ලිඛිත පරීක්ෂණය

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| I. ආයතන සංග්‍රහය/පළාත් මුදල් රීති සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය දැනුම<br><br>මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ III ,V,VII ,XXIII පරිච්ඡේද හා දෙවන පරිච්ඡේදයේ XLVII ,XLVIII පරිච්ඡේද සමඟ පළාත් මුදල් රීති සංග්‍රහයේ මු.නි.51 ,52 හා 54, 55 මත ප්‍රශ්න පත්‍රය සැකසේ. | පැය 01 | 100 |

ප්‍රායෝගික පරීක්ෂණය

| | | |
|---|---|---|
| 1. ජීව වෛද්‍ය ඉංජිනේරු කාර්මික සේවා පිළිබඳ විෂය දැනුම මැන බැලීම සඳහා වන සෞඛ්‍ය ආයතනවල විදුලි වෛද්‍ය උපකරණ හා තාක්ෂණික උපකරණවල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය. | පැය 1/2 | 100 |
| මුළු එකතුව | | 200 |

විභාගය සාමාර්ථය සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් ලකුණු 40 % ක් ලබා ගත යුතුය

(ආ) උසස් වීමේ ක්‍රමය :-

මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්පත් ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් කැඳවනු ලැබේ. මෙම විභාගය පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ සේවකයින්ට අයදුම් කළ හැක. මෙම විභාගය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරකි. සෑම වසරකටම එක් වරක් මෙම විභාගය ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලැබේ. විභාගය සඳහා ඉල්ලුම් කිරීමට ආකෘති අංක 02 භාවිතා කළ යුතු වේ.

සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ විභාගය සමත් හා අනිකුත් පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් නියමිත ආකෘති පත්‍රය මගින් ආයතන ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට සම්මුඛ පරීක්ෂණයකින් පසු පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු උසස් වීම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

## 11.3 සේවක ගණයෙහි I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

### 11.3.1 සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවක ගණයේ I ශ්‍රේණියේ වසර දහයක( 10) සේවා කාලයක් තිබිය යුතුය.

II. උසස් වීම් ලබන දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයා ගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

III. I , II හා III කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්න වසර දහය( 10) තුළ සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය ඇසුරින් ආයතන ප්‍රධානියා මඟින් අමාත්‍යාංශ ලේකම් මඟින් ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් උසස් වීම් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

### 11.3.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. I ශ්‍රේණියේ වසර නවයක (09) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. අයදුම් කරන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව උසස්වීමේ පූර්වාසන්න වසර නවය(09) තුළ හොඳයි හෝ රට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

VI. විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත්ව තිබීම.

### 11.3.3 විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සඳහා විභාග විෂය නිර්දේශය

*ලිඛිත පරීක්ෂණය :-*

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි ආශ්‍රිත මූලික කරුණු<br>මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ XXVIII , XXXII ,XXV , XLVII , XLVIII පරිච්ඡේද හා මුදල් රීති සංග්‍රහයේ මු.නි.82,83,84, 85 ජේද පදනම් වේ. | පැය 0 1 | 100 |

*ප්‍රායෝගික පරීක්ෂණය :-*

| | | |
|---|---|---|
| 2. ජීව වෛද්‍ය ඉංජිනේරු කාර්මික සේවා පිළිබඳ විෂය දැනුම මැන බැලීම සඳහා සෞඛ්‍ය ආයතනවල භාවිතා කරන විදුලි වෛද්‍ය උපකරණ හා රෝහල්වල භාවිතා කරන වෙනත් තාක්ෂණික උපකරණවල සුළු අළුත්වැඩියා මැන බැලීමේ ප්‍රායෝගික පරීක්ෂණයකි. | පැය 0 1 | 100 |
| මුළු එකතුව | | 200 |

විභාගය සාමාර්ථය සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් ලකුණු 40 % ක් ලබා ගත යුතුය

(ආ) උසස් වීමේ ක්‍රමය

මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්පත් ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් කැඳවනු ලැබේ. මෙම විභාගය පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ සේවකයින්ට අයදුම් කළ හැක. සෑම වසරකටම එක් වරක් මෙම විභාගය ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලැබේ. විභාගය සඳහා ඉල්ලුම් කිරීමට ආකෘති අංක 03 භාවිතා කළ යුතු වේ.

උසස් කිරීමේ විභාගය සමත් හා අනිකුත් පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් නියමිත ආකෘති පත්‍රය මගින් ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට සම්මුඛ පරීක්ෂණයකින් පසු පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු උසස් වීම් ලබා දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

**12. අන්තර්කාලීන විධි විධාන යටතේ අන්තර්ග්‍රහණය කිරීම් :-**

12. 1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 IV මගින් ලබා දී ඇති PL - 3 2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධි විධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය.

I. PL - 3 - III ශ්‍රේණිය

(අ) PL - 3 - 2006 A වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II හා I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL - 3 - III ශ්‍රේණියට 2008.07.0 1 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. PL - 3 - II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 20 ට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) PL - 3 - 2006 A වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක කාලයක් සම්පූර්ණ කර නැති සේවකයන්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL - 3- II ශ්‍රේණියට 2008.07.0 1 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

III. PL - 3 - I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක් හෝ ඊට වැඩි එහෙත් අවු 30 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු 19 ක සේවා කාලයක් ඇති , එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඇ) PL – 3 – 2006 A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 ක සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL – 3- I ශ්‍රේණියට 2008.07.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

IV. PL – 3 විශේෂ ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 19 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඈ) PL – 3 – 2006 A වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන සේවකයින්.

PL – 3 – විශේෂ ශ්‍රේණියට 2008.07.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

* මෙම සියළුම අන්තර්ග්‍රහණය කිරීම් සඳහා ආයතන ප්‍රධානියා මගින් ඉල්ලීම් කළ පසු ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් අන්තර්ග්‍රහණය කිරීමේ ලිපි නිකුත් කරනු ලැබේ.

3. පාලනය

13.1 ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර මෙම බඳවා ගැනීමේ පරිපාටියෙන් පාලනය වේ.

13.2 මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සළසා නොමැති කරුණු පිළිබඳව ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 විධි විධාන ප්‍රකාර සංශෝධන ඇතුළත් කර ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික බඳවා ගැනීම සඳහා සකස් කරන ලද පරිපාටිය බව සහතික කරමි. අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

2010.03.03

දිනය

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(ඌව)

නිල මුද්‍රාව

වෛද්‍ය නිලමිණී රාජපක්ෂ-හේවාගමගේ
විද්‍යාපති, වෛද්‍ය විශාරද
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක
ඌව පළාත

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :-**

නිර්දේශ කරමි/ ~~නොකරමි~~

අංකය :- 5/ආ/1/19

දිනය :- 2010.03.03

අත්සන :- [signature]

(නිල මුද්‍රාව)

පී.ඒ.එම්.එස්.පී. අඹන්වල
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස
ළමාරක්ෂක සහ වනිතා කටයුතු
ඌව පළාත

**ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :-**

නිර්දේශ කරමි/ ~~නොකරමි~~

අංකය :- 4/හ/3/7/21

දිනය :- 2010.03.17

අත්සන :- [signature]

පී.බී. අමරසේකර
(නිල මුද්‍රාව)
ප්‍රධාන ලේකම්, ඌව පළාත

**ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :-**

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනුමත කරමි

1. සභාපති :- [signature]
2. සාමාජික :- [signature]
3. සාමාජික :- [signature]
4. සාමාජික :-
5. සාමාජික :--

දිනය :- 2010/3/25

ආණ්ඩුකාරවර ලේකම්

2010/3/25 .. දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක ..... (14) ..... යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරු සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

ලේකම්,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය

අනුමත කරමි/~~නොකරමි~~

( සි.නන්ද මැතිව්)
ඌව පළාත් ආණ්ඩුකාරවර
සී. නන්ද මැතිව්
ඌව පළාත් ආණ්ඩුකාරවර

දිනය :- 2010.06.21

"කාර්යක්ෂමතාවයෙන් යුත් පළාත් රාජ්‍ය සේවයක්"

ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ஊவா மாகாண அரசாங்க சேவை ஆணைக்குழு
Uva Provincial Public Service Commission

අංක 199, කැප්පෙටිපොල පාර, බදුල්ල. இல. 199, கெப்பெடி பொல வீதி, பதுளை. No. 199, Keppetipola Road, Badulla.

මගේ අංකය / எனது இல / My No. 3/PA/C/1-33

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2010-01-28

02 FEB 2010

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
බදුල්ල.

## ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය.

ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත්තේ පහත සංශෝධනයට යටත්වය.

" තෝරා ගනු ලබන්නන් ආයතන සංග්‍රහය,පළාත් සභා මුදල් රීති සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග/රෙගුලාසි හා රජය මගින් හෝ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් දැනට නිකුත් කර ඇති හා කලින් නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසි වලටද යටත් විය යුතුය. "

02. එබැවින් පරිපාටියේ ඡේද අංක 6.1 ඉහත පරිදි සංශෝධනය කිරීම ආයතන සංග්‍රහයේ I වන බාණ්ඩයේ II වන පරිච්ඡේදයේ අංක 2.9 සිට 2.11 දක්වා වු කරුණු අනුව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර, මේ සමඟ අනුමත පරිපාටියද එවමි.

(නිරෝෂා දීපනි ඊශ්වර)
සහකාර ලේකම් / ලේකම් වෙනුවට
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත්- 01. ප්‍රධාන ලේකම් - දැ.ගැ.පි.
02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක - අ.ක.ස.

ගරු සභාපතිතුමා / கௌ.தவிசாளர் / Hon. Chairman 055 - 2222150
ලේකම් / செயலாளர் / Secretary 055 - 2223482
සහකාර ලේකම් / உதவிச்செயலாளர் / Asst.Secretary 055 - 2225148
නිවස / இல்லம் / Residence 057 - 2222744
ෆැක්ස් / பெக்ஸ் / Fax 055 - 2223482
පරිපාලන නිලධාරි / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer 055 - 2222400

# ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2009.06.05 දින අනුමත කරන ලද ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය (සංශෝධිත)වෙනුවට පහත සඳහන් බඳවා ගැනීමේ පරිපාටිය පළ කරනු ලැබේ.

01. තනතුරේ නාමය - ඌව පළාත් රාජ්‍ය සේවයේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර

02. තනතුර අයත් දෙපාර්තමේන්තුව - ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

අමාත්‍යාංශය - ඌව පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය

03. ක්‍රියාත්මක වන දිනය - ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමා අනුමත කරන ලද දිනය වේ.

04. අර්ථ නිරූපණ

04.1 බඳවා ගැනීමේ පරිපාටිය යන පදයෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය වේ.

04.2 කොමිෂන් සභාව යනුවෙන් අදහස් වන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

04.3 ප්‍රධාන ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයා වේ.

04.4 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

04.5 අමාත්‍යාංශ ලේකම් යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

04.6 දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වේ.

04.7 සේවාව යන පදයෙන් අදහස් කරන්නේ ඌව පළාත් රාජ්‍ය සේවයේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික සේවය වේ.

04.8 " නියමිත දිනය" යනුවෙන් අදහස් කරනුයේ මෙම සේවයට / බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනය වේ.

04.9 මෙම බඳවා ගැනීමේ පරිපාටියට අදාළ කාර්යයන් සඳහා "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වසර 05 ක සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූද ඒ කාලය තුළ කළ වරදකට අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර දඬුවමක් නැත්තා වූද සේවා කාලයකි.

**05.** **තනතුරේ සාරාංශය**

ඌව පළාතේ සියළුම රෝහල් හා සෞඛ්‍ය ආයතනවල වෛද්‍ය උපකරණ හා අනෙකුත් විදුලි උපකරණ අළුත්වැඩියාව හා නඩත්තු කටයුතු කිරීම වේ.

**06.** **සේවා කොන්දේසි :-**

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු,අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

06. 1. තෝරා ගනු ලබන්නන් ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග / රෙගුලාසි හා රජය මගින් හෝ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කළ නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසි වලට ද යටත් විය යුතුය

06.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 ප්‍රකාරව පත්වීමේ දින සිට වසර පහක් (05) තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

06.3 ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේද වල වට විධාන ද අදාළ වේ.

**07.** **වැටුප් ක්‍රමය හා සේවක ව්‍යුහය :-**

7.1 සේවක ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය PL -3 - 2006 ඒ
රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860

7.2 සේවක ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක මාසික වැටුප් පියවර

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් පරිමාණය | ආරම්භක වැටුප | වැටුප් කේත අංකය |
|---|---|---|---|---|
| III | පියවර 01 | රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860 | රු. 12470 /- | PL - 3- 2006 A |
| II | පියවර 12 | රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860 | රු. 139 15/- | |
| I | පියවර 22 | රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860 | රු. 15380/- | |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු. 12470 - 10 x 130 - 10 x 145 - 10x 160 - 12 x 170 - 18860 | රු. 16990/- | |

7.3 සේවක ව්‍යුහය

එක් එක් ශ්‍රේණිය සඳහා වෙන් වු සේවක සංඛ්‍යාවක් නොමැත. III , II , I සහ විශේෂ ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් වේ.

## 08. බඳවා ගැනීමේ සුදුසුකම්

8.1.1 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-

(අ) **අධ්‍යාපන සුදුසුකම්**

භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන හෝ අර්ධ ශිල්පීය තනතුරක සතුටුදායක වසර 03 ක සේවා කාලයක් සපුරා තිබීම.

(ආ) **වෘත්තිය සුදුසුකම්**

I. ඌව පළාත් රාජ්‍ය සේවයට පත් කරන ලද /අන්තර්ග්‍රහණය කරන ලද ඌව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ස්ථිර නිළධාරියෙකු වීම.

II. විදුලි වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම්, දෝෂ හඳුනා ගැනීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳව වසර 03 ක පළපුරුද්ද

III. රජයේ පිළිගත් ආයතනයකින් විදුලි හෝ විද්‍යුත් ක්ෂේත්‍ර පිළිබඳ අර්ධ කාලීන පාඨමාලාවක් හදාරා තිබීම.

8.1.2 බාහිර අයදුම්කරුවන් සඳහා :-

(අ) **අධ්‍යාපන සුදුසුකම්**

භාෂාව, ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් 06 කින් එකවර විෂයයන් 05 කට නොඅඩු දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.

(ආ) වෘත්තිය සුදුසුකම්

I. රජයේ පිළිගත් ආයතනයකින් විදුලි හෝ විද්‍යුත් ක්ෂේත්‍ර වලින් තුන් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවක් සමත් වී තිබීම.

හෝ

II. එංගලන්තයේ සිටි ඈන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ විදුලි හෝ විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පූර්ණ තාක්ෂණික සහතිකය ලබා තිබීම. (FULL TECHNOLOGICAL CERTIFICATE)

හා

III. අදාළ ක්ෂේත්‍රයේ වසර 3 ක පළපුරුද්දක් ලබා තිබීම. එය රජයේ හෝ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගත් සහතිකයකින් සනාථ විය යුතුය.

8.2 පොදු යෝග්‍යතා :-

8.3.1 යහපත් චරිතයකින්හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

8.3.2 ඌව පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03 ක වත් ස්ථිර පදිංචිය ඇති පිරිමි අයදුම්කරුවන් විය යුතුය. ඡන්ද හිමි නාම ලේඛණය මගින් පදිංචිය සනාථ කළ යුතුය.

8.3.3 බඳවා ගැනීමට අදාළව අයදුම්පත් කැඳවන දිනට හෝ නියම කරනු ලබන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවෙකුට එනම් ඒ වන විටත් රාජ්‍ය සේවයේ හෝ ඌව පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයෙක් නම් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

09. බඳවා ගැනීමේ ක්‍රමය :-

9.1 ඌව පළාත් රාජ්‍ය සේවයේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% ක ප්‍රමාණය අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් ද , 50% ක ප්‍රමාණය බාහිර අයදුම්කරුවන්ගෙන් ද බඳවා ගනු ලැබේ. සුදුසුකම් සපුරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් , සියළුම පුරප්පාඩු බාහිර අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

(1) දෙපාර්තමේන්තුවේ නිවේදනයක් මගින් පළමුව අභ්‍යන්තර අයදුම්කරුවන් (දෙපාර්තමේන්තුගත ස්ථිර පත්වීම් ලැබූ) අතරින් අයදුම්පත් කැඳවීමෙන් පසුව පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක සහ වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

(II) සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති විට දී රජයේ ගැසට් පත්‍රයේ නිවේදනයක් හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසුව පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත හා වෘත්තිය පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

## විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරේ III වැනි ශ්‍රේණියට අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේ තරඟ විභාගයේ විෂය නිර්දේශය

(I) විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය, ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලැබේ.

**විභාග විෂය නිර්දේශය**

(අ) ලිඛිත පරීක්ෂණය

| | විෂය | ලකුණු | කාලය | සමත්වීම සඳහා ලකුණු තත්ත්වය |
|---|---|---|---|---|
| 1. | සාමාන්‍ය දැනීම | 100 | පැ.02 | 40% |
| (ආ) | වෘත්තිය පරීක්ෂණය | 100 | පැ.02 | 50% |
| | | 200 | | |

**සාමාන්‍ය දැනීම :-**

දේශීය හා විදේශීය භූගෝලීය, ආර්ථික, සාමාජීය හා දේශපාලනික වශයෙන් සාමාන්‍ය දැනීම පරීක්ෂා කරන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

**වෘත්තිය පරීක්ෂණය :-**

පහත සඳහන් විෂයන් යටතේ වෘත්තිය පරීක්ෂණය සිදු කරනු ලැබේ.

01. POWER AND ELECTRICITY

Properties of Electricity, Measurment units of voltage, Current and power, Ohm /s Law, Introduction to electrical circuits.

02. ELECTRONICS

Introduction to electronic items, Color codes used for the resistors, Introduction to P/N Junction and diode, Transistor and Identification of transistors, Intergraded circuits.

03. HOUSE WIRING AND APPLIED ELECTRICITY

Introduction to single phase and three phase electricity, Standards for house wiring, Wiring techniques, Measurment of power

**04.** ELECTRICAL MACHINES

D/C Motors, Single phase motors, Three phase motors, Stardelta conversion, Generations

**05.** MECHANICS OF MACHINES

General Knowledge on properties of materials, Introduction to mechanical power conversion, Piston cylinder arrangement, Water pumps and impellers

- **1/ 16" පරිමාණයක් කියවීමට ඇති හැකියාව**
- සරළ රයම් පැස්සිම් කිරම සහ ෆිට් කිරීම පිළිබඳ මූලික දැනුම
- **පහත සඳහන් විදුලි වෛද්‍ය උපකරණ හා රෝහල්වල භාවිතා කරන වෙනත් තාක්ෂණික උපකරණවල දෝෂ හඳුනා ගැනීම. අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම හා ක්‍රියාත්මක කිරීමේ දී ක්‍රියාකරුවන්ගේ හා රෝගීන්ගේ ආරක්ෂාව පිළිබඳ දැනුම**

Dental chair and unit, Ultra Sound, Scalar Machine, ECG Recorder, ENT Head lamp with band, Heavy dirty Nebulizer, Larynogoscope, Mobile X - Ray Unit, Single jar Sucker, Spygmomanometer, Lung function machine, CTG machine, Doppler, Defibrillator, Infusion pump, Multipara Monitor, Pulse Oxymeter, Syringer pump, Transport Ventlator, Binocular, Microscope, Centrifuge, Color meter, Flame photometer, Laboratary Autoclave, Water Distillers, Anesthetic Machine, OT Table, OT Lamp, Theraputic, Ventilator, Infant Warmer, Phototherapy Unit, Biochemistry Analayer (Semi Automated) Baby Incubator, Anesthetic Ventilator.

**10.** **කාර්යක්ෂමතා කඩඉම්**

ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වනු ලැබේ.

**10. 1** (අ) **පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ඇතුළත සමත් විය යුතුය.**

(ආ) **දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ සේවයේ II ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ඇතුළත සමත් විය යුතුය.**

(ඇ) **තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ඇතුළත සමත් විය යුතුය.**

(ඈ) කාර්යක්ෂමතා කඩ ඉම සමත් වීම සඳහා එක් එක් විෂයට ලකුණු 40 % ක් ලබා තිබිය යුතුය. ඉහත සඳහන් විෂයන්ට වෙන වෙනම පෙනී සිටිය හැක.

(ඉ) ඉහත සඳහන් පරිදි නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවන තැනැත්තන් පිළිබඳව ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව ක්‍රියාකරනු ලැබේ. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් පවත්වනු ලැබේ.

10. 1. 1 පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත වේ.

| විෂය | කාලය | ලකුණු |
| --- | --- | --- |
| 0 1. සාමාන්‍ය කාර්යාල ක්‍රම සහ ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව ආයතන සංග්‍රහයේ පරිච්ඡේද II, III, XII XIII පිළිබඳව මූලික දැනුම පරීක්ෂා කරනු ලැබේ. | පැ. 1 | 100 |
| 02. විදුලි වෛද්‍යායාන්ත්‍රික තනතුරට අදාළ දැනුම පරීක්ෂා කරන ප්‍රායෝගික පරීක්ෂණයකි | පැ. 1 | 100 |
| මුළු ලකුණු | | 200 |

10. 1.2 දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය

මෙය ලිඛිත පරීක්ෂණයකි.

| විෂය | කාලය | ලකුණු |
| --- | --- | --- |
| 0 1. ආයතන සංග්‍රහය සහ පළාත් මුදල් රීති සංග්‍රහය පිළිබඳ මූලික දැනුම<br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද V, VII, XII, XXIV පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරනු කරනු ලැබේ. | පැ. 1 | 100 |
| 02. පළාත් මුදල් රීති සංග්‍රහය<br>මු.නි.5 1,52, 54, 55, 144, 145, 2 15,2 16 | පැ. 1 | 100 |
| මුළු ලකුණු | | 200 |

10.1.3 <u>තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය</u>

මෙය ලිඛිත පරීක්ෂණයකි.

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරට අදාළ විෂයානුබද්ධ දැනුම පිළිබඳ පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රය (බලය හා විදුලිය, විද්‍යුත් උපකරණනඩත්තුව) | පැ. 1 | 100 |
| මුළු ලකුණු | | 100 |

කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලබන දින වකවානු විභාග පවත්වන දිනට අවම වශයෙන් මාස 03 කට කලින් අදාළ සේවකයින් වෙත චක්‍රලේඛයක් මගින් අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

## 11. උසස් වීම් -

කාර්ය සාධනය පදනම් කර ගත් පහත දැක්වෙන ආකාරයේ උසස් වීම් ක්‍රමයක් ගිම් වේ.

11.1 සේවක ගණයෙහි III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

11.1.1 සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්,

(අ) පූර්ව අවශ්‍යතා

I. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබීම.

II. සේවක ගණයේ III ශ්‍රේණියේ වසර දහයක ( 10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

III. රාජ්‍ය පරිපාලන 8/98 චක්‍රලේඛ අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් පූර්වාසන්න වසර දහය( 10) තුළ පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

V. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර තිබීම.

VI. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් ආයතන ප්‍රධානියා මගින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසුව II ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

**11.1.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්**

(අ) පූර්ව අවශ්‍යතා

I. පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබීම.

II. III ශ්‍රේණියේ වසර හය (06) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන 8/98 චක්‍රලේඛ අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්න වසර පහ (05) තුළ හොඳයි හෝ ඉහළ සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර හය (06) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනයේදී සමත් වී තිබීම.

VI. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

VII. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් විභාගය සමත්ව තිබීම.

**11.1.3. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් වීම් සඳහා විභාග විෂය නිර්දේශය :-**

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 1. **ආයතන සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය දැනුම**<br>ආයතන සංග්‍රහයේ II, VII, XII යන පරිච්ඡේද මත ප්‍රශ්ණ පත්‍රය සැකසේ. මෙය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි | පැය 01 | 40 |
| 2. **වාචික පරීක්ෂණය**<br>අදාළ සේවකයාට පැවරෙන සියළුම කාර්යයන් මැන බැලීම සඳහා වාචික පරීක්ෂණයකි. මේ යටතේ භාෂාමය හැකියාව, පෞරුෂත්වය, තීරණ ගැනීමේ ස්වරූපය මැන බලනු ලැබේ | විනාඩි 10 | 40 |
| 3. **රාජකාරී වැඩ පැමිණීම හා හැසිරීම**<br>වැඩ පැමිණීම හා හැසිරීම සඳහා ලකුණු ආයතන ප්‍රධානීන් වෙතින් ලබා ගන්නා රහස්‍ය වාර්තා මගින් තීරණය කරනු ලැබේ. | | 20 |
| **මුළු එකතුව** | | 100 |

විභාගය සාමාර්ථය සඳහා අවම වශයෙන් ලකුණු 50 % ක් ලබා ගත යුතුය

(ආ) උසස් වීමේ ක්‍රමය

මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්පත් ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් කැඳවනු ලැබේ. මෙම විභාගය සඳහා පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ සේවකයින්ට අයදුම් කළ හැක. මෙම විභාගය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරකි. සෑම වසරකටම එක් වරක් මෙම විභාගය ඌව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විෂයභාර ලේකම් විසින් පවත්වනු ලැබේ.

සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ විභාගය සමත් හා අනිකුත් පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් ආයතන ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට සම්මුඛ පරීක්ෂණයකින් පසු පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු උසස්වීම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

## 11.2 සේවක ගණයෙහි II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

### 11.2.1 සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. II ශ්‍රේණියේ වසර දහයක ( 10) සේවා කාලයක් තිබිය යුතුය.

II. උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

III. I හා II කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබිය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්න වසර නවය(09) තුළ සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය ඇසුරින් ආයතන ප්‍රධානියා මගින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු I ශ්‍රේණියට උසස් කිරීම ඌව පළාත් සෞඛ්‍ය දේශීය වෛද්‍ය විෂයභාර ලේකම් විසින් උසස් වීම් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

## 11.2.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. II ශ්‍රේණියේ වසර අටක(08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම .

II. පූර්වාසන්න වසර පහක (05) කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව උසස්වීමේ පූර්වාසන්න වසර පහ(05) තුළ හොඳයි හෝ රට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. I හා II කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබීම.

VI. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් විභාගය සමත් වී තිබීම.

## 11.2.3 සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් වීම සඳහා විභාග විෂය නිර්දේශය

I වන පන්තියට උසස් කිරීමට අදාළ අභියෝගතා පරීක්ෂණයේ විෂය නිර්දේශය

මෙම පරීක්ෂණය කොටස් 02 කි.

1. ලිඛිත පරීක්ෂණය
2. ප්‍රායෝගික පරීක්ෂණය

## ලිඛිත පරීක්ෂණය

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| I. ආයතන සංග්‍රහය/පළාත් මුදල් රීති සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය දැනුම<br><br>මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ III ,V,VII ,XXIII පරිච්ඡේද හා දෙවන පරිච්ඡේදයේ XLVII ,XLVIII පරිච්ඡේද සමඟ පළාත් මුදල් රීති සංග්‍රහයේ මු.නි.51 ,52 හා 54, 55 මත ප්‍රශ්න පත්‍රය සැකසේ. | පැය 01 | 100 |

**ප්‍රායෝගික පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 1. ජීව වෛද්‍ය ඉංජිනේරු කාර්මික සේවා පිළිබඳ විෂය දැනුම මැන බැලීම සඳහා වන සෞඛ්‍ය ආයතනවල විදුලි වෛද්‍ය උපකරණ හා තාක්ෂණික උපකරණවල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය. | පැය 1/2 | 100 |
| මුළු එකතුව | | 200 |

විභාගය සාමාර්ථය සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතුය.

(ආ) උසස් වීමේ ක්‍රමය :

මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්පත් ඉාව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් කැඳවනු ලැබේ. මෙම විභාගය පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ සේවකයින්ට අයදුම් කළ හැක. මෙම විභාගය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරකි. සෑම වසරකටම එක් වරක් මෙම විභාගය ඉාව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලැබේ. විභාගය සඳහා ඉල්ලුම් කිරීමට ආකෘති අංක 02 භාවිතා කළ යුතු වේ.

සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ විභාගය සමත් හා අනිකුත් පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් ආයතන ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට සම්මුඛ පරීක්ෂණයකින් පසු පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු උසස් වීම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

## 11.3 සේවක ගණයෙහි I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

### 11.3.1 සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. සේවක ගණයේ I ශ්‍රේණියේ වසර නවයක(09) සේවා කාලයක් තිබිය යුතුය.

II. උසස් වීම් ලබන දිනට පූර්වාසන්න වසර 05 ක කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයා ගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

III. I, II හා III කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව පූර්වාසන්න වසර දහය( 10) තුළ සතුටුදායක මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(ආ) උසස් වීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් ආයතන ප්‍රධානියා මගින් අමාත්‍යාංශ ලේකම් මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම ටාව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් උසස් වීම් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ.

## 11.3.2 සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

(අ) පූර්ව අවශ්‍යතා

I. I ශ්‍රේණියේ වසර අටක (08) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. අයදුම් කරන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලයක් තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/98 කාර්ය සාධන ඇගයීම් වාර්තාව අනුව උසස්වීමේ පූර්වාසන්න වසර නවය(09) තුළ හොඳයි හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය පරිපාලන 3/2007 හා 7/2007 චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

V. I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

VI. විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත්ව තිබීම.

## 11.3.3 විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සඳහා විභාග විෂය නිර්දේශය

*ලිඛිත පරීක්ෂණය :-*

| විෂය | කාලය | ලකුණු |
|---|---|---|
| 1. ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි ආශ්‍රිත මූලික කරුණු<br>මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ XXVIII , XXXII ,XXV , XLVII , XLVIII පරිච්ඡේද හා මුදල් රීති සංග්‍රහයේ මු.නි.82,83,84, 85 ජේද පදනම් වේ. | පැය 01 | 100 |

ප්‍රායෝගික පරීක්ෂණය :-

| | | |
|---|---|---|
| 2. ජීව වෛද්‍ය ඉංජිනේරු කාර්මික සේවා පිළිබඳ විෂය දැනුම මැන බැලීම සඳහා සෞඛ්‍ය ආයතනවල භාවිතා කරන විදුලි වෛද්‍ය උපකරණ හා රෝහල්වල භාවිතා කරන වෙනත් තාක්ෂණික උපකරණවල සුළු අළුත්වැඩියා මැන බැලීමේ ප්‍රායෝගික පරීක්ෂණයකි. | පැය 0 1 | 100 |
| මුළු එකතුව | | 200 |

විභාගය සාමාර්ථය සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් ලකුණු 40 % ක් ලබා ගත යුතුය

(ආ) උසස් වීමේ ක්‍රමය

මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්පත් ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් කැඳවනු ලැබේ. මෙම විභාගය පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ සේවකයින්ට අයදුම් කළ හැක. සෑම වසරකටම එක් වරක් මෙම විභාගය ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

උසස් කිරීමේ විභාගය සමත් හා අනිකුත් පූර්ව සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් නියමිත ආකෘති පත්‍රය මගින් ආයතන ප්‍රධානියා / දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට සම්මුඛ පරීක්ෂණයකින් පසු පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු උසස් වීම් ලබා දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.

12. අන්තර්කාලීන විධි විධාන යටතේ අන්තර්ග්‍රහණය කිරීම් :-

12.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 IV මගින් ලබා දී ඇති PL – 3 – 2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධි විධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය.

I. PL – 3 – III ශ්‍රේණිය

(අ) PL – 3 – 2006 A වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ආ) ඉහත-සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II හා I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL – 3 – III ශ්‍රේණියට 2008.07.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. PL – 3 – II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක හෝ රට වැඩි එහෙත් අවුරුදු 20 ට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) PL – 3 – 2006 A වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක කාලයක් සම්පූර්ණ කර නැති සේවකයන්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද I හෝ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL – 3- II ශ්‍රේණියට 2008.07.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

III. PL – 3 – I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක් හෝ රට වැඩි එහෙත් අවු 30 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක් හෝ රට වැඩි එහෙත් අවුරුදු 19 ක සේවා කාලයක් ඇති , එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඇ) PL – 3 – 2006 A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්.

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 ක සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

PL – 3- I ශ්‍රේණියට 2008.07.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

IV. PL – 3 විශේෂ ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 30 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 19 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඈ) PL – 3 – 2006 A වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන සේවකයින්.

PL – 3 – විශේෂ ශ්‍රේණියට 2008.07.01 දිනට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

* මෙම සියළුම අන්තර්ග්‍රහණය කිරීම් සඳහා ආයතන ප්‍රධානියා මගින් ඉල්ලීම් කළ පසු ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම් විසින් අන්තර්ග්‍රහණය කිරීමේ ලිපි නිකුත් කරනු ලැබේ.

3. පාලනය

13.1 ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර මෙම බඳවා ගැනීමේ පරිපාටියෙන් පාලනය වේ.

13.2 මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සළසා නොමැති කරුණු පිළිබඳව ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් මත ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තිරණය කරනු ලැබේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 විධි විධාන ප්‍රකාර සංශෝධන ඇතුළත් කර ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික බඳවා ගැනීම සඳහා සකස් කරන ලද පරිපාටිය බව සහතික කරමි. අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

2009.10.30
දිනය

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ(ඌව)
නිල මුද්‍රාව
වෛද්‍ය හීලමණි රාජපක්ෂ හේවාගිගන
විද්‍යාපති, වෛද්‍ය විශාරද
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක
ඌව පළාත

**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :-**

නිර්දේශ කරමි/ නොකරමි

අංකය :- 5/අ/1/19

දිනය :- 2009.10.30

අත්සන :-

ජී.ඩබ්.එම්.ඩී.සී.පී. අබන්වල
ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභ සාධන,
පුනරුත්ථාපන හා ළමාරක්ෂක අමාත්‍යාංශය,
ඌව පළාත.

**ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :-**

නිර්දේශ කරමි/ නොකරමි

අංකය :- ය/ක/3/7/1/7

දිනය :- 2009.11.11

අත්සන :-

(නිල මුද්‍රාව) බී. අමරසේකර
ප්‍රධාන ලේකම්, ඌව පළාත

**ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :-**

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනුමත කරමි

1. සභාපති :-
2. සාමාජික :-
3. සාමාජික :-
4. සාමාජික :-
5. සාමාජික :-

දිනය :- 2009-12-3

**ආණ්ඩුකාරවර ලේකම්**

2009-12-3 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 20 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඌව පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරු සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

ලේකම්,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය

අනුමත කරමි/නොකරමි

(සි.නන්ද මැතිව්)
ඌව පළාත් ආණ්ඩුකාරවර

දිනය :- 2010.01.11